**හබරාදූව ප්‍රාදේශීය සභාව**

**ගාල්ල දිස්ත්‍රික්කය**

**------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 ජුලි 06 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 අගෝස්තු 13 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2015 අගෝස්තු 31 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 මතය

-------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට හබරාදූව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 03 ක් වෙනුවෙන් ලැබිය යුතු මූලධන ආධාර රු.1,461,771 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමුච්චිත අරමුදල් හා ණයගැතියන් රු.1,461,771 කින් අඩුවෙන් දැක්විණි.

(ආ) ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 05 ක් වෙනුවෙන් ගෙවිය යුතු රු.2,459,699 ක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබීම හා සමාලෝචිත වර්ෂයේ දී එම ගෙවීම රු.2,459,699 ක් ණයහිමි ගිණුමට හර කිරීම නිසා සමුච්චිත අරමුදල රු.2,459,699 කින් වැඩියෙන් ද ණයහිමියන් රු.2,459,699 කින් අඩුවෙන් ද දැක්විණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට මුදල් මාරු ගිණුම් ලෙස දක්වා තිබූ රු.26,600,000 ක හර හා බැර ශේෂ වර්ෂය අවසානයේ එකිනෙක ගිණුම් පියවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළ රු.355,626 ක ණය ආපසු ගෙවීම් අදාල ණය ගිණුමෙහි සටහන් නොවීම නිසා ණය ගිණුම රු.355,626 කින් වැඩියෙන් දැක්විණි.

(ඉ) සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ රු.354,431 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම රු.354,431 කින් අඩුවෙන් දැක්විණි.

(ඊ) ඉකුත් වර්ෂයන්හි මුද්දර ගාස්තු ලැබීම් රු.649,415 ක් මූල්‍ය ප්‍රකාශනවල ලැබිය යුතු උසාවි දඩ ගිණුමට ගැලපීම හේතුවෙන් ලැබිය යුතු මුද්දර ගාස්තු රු.649,415 කින් වැඩියෙන් ද ලැබිය යුතු උසාවි දඩ එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දැක්විණි.

(උ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු උසාවි දඩ රු.645,966 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් ලැබිය යුතු උසාවි දඩ හා සමුච්චිත අරමුදල් රු.645,966 බැගින් අඩුවෙන් දැක්විණි.

(ඌ) ඉකුත් වර්ෂයේ ලැබී තිබූ සේවක අර්ථසාධක අරමුදල් ප්‍රතිලාභ රු.153,300 ක් ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල උසාවි දඩ ආදායම් ලෙස දක්වා තිබීම නිවැරදි නොකිරීම නිසා සමුච්චිත අරමුදල රු.153,300 ක් වැඩියෙන් ද, සේවක අර්ථසාධක අරමුදල් තැන්පතු එම ප්‍රමාණයෙන් අඩුවෙන් ද දැක්විණි.

(එ) ඉකුත් වර්ෂයේ දේශීය ණය සහ සංවර්ධන අරමුදලට පොලී වශයෙන් ගෙවන ලද රු.50,510 ක් දේශීය ණය සහ සංවර්ධන ණය ගිණුමට හර කර තිබීම නිවැරදි නොකිරීම නිසා සමුච්චිත අරමුදල රු.50,510 කින් වැඩියෙන් ද, දේශීය ණය සහ සංවර්ධන අරමුදල් ණය ශේෂය රු.50,510 කින් අඩුවෙන් ද දැක්විණි.

(ඒ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විශ්‍රාමික පළාත් පාලන සේවකයින් වෙනුවෙන් විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල් වෙත ගෙවිය යුතු විශ්‍රාම වැටුප් දායක මුදල් රු.5,870,837 ක් වෙනුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂය තුල හා ඉකුත් වර්ෂයේ මිලදී ගෙන තිබූ රු.457,050 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, රු.263,900 ක් වූ ලී බඩු හා සවිකිරීම් සහ රු.2,070 ක් වූ පුස්තකාල පොත් මිලදී ගැනීම් ද වශයෙන් එකතුව රු.723,020 ක් වූ ස්ථාවර වත්කම් ප්‍රාග්ධනීත කර නොතිබුණි.

(ඕ) ප්‍රධාන ලෙජරය අනුව සමුච්චිත අරමුදල හා සංචිත ශේෂය රු.36,726,616 ක් හා මූල්‍ය ප්‍රකාශනවල ශේෂය රු.35,919,531 ක් වීමෙන් රු.807,085 ක වෙනසක් දැක්විණි.

(ක) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පත් පොලිය රු.430,790 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.521,252 ක් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ආදායම හා ස්ථාවර තැන්පතු රු.90,462 කින් වැඩියෙන් දැක්විණි.

(ග) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත 22 ක් වෙනුවෙන් ලැබිය යුතු මූලධන ආධාර රු.11,577,830 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මූලධන ආධාර හා ණයගැතියන් රු.11,577,830 බැගින් අඩුවෙන් දැක්විණි.

(ජ) සමාලෝචිත වර්ෂය තුල රු.736,430 ක ලී බඩු උපකරණ හා සවිකිරීම් මිලදී ගැනීම් මූල්‍ය ප්‍රකාශනවල පුනරාවර්තන වියදම් ලෙස දක්වා තිබුණි.

(ට) ඉකුත් වර්ෂයේ කර්මාන්ත 34 ක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලද ප්‍රාග්ධන ආධාර රු.16,270,926 ක් වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලැබීම් ලෙස දක්වා තිබීමෙන් ප්‍රාග්ධන ආධාර හා ණයගැතියන් රු.16,270,926 බැගින් වැඩියෙන් දැක්විණි.

(ඩ) සමාලෝචිත වර්ෂයේ කර්මාන්ත ගිණුමට සාමාන්‍ය ගිණුමෙන් මාරු කරන ලද රු.3,000,000 ක් වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ලැබීම් ලෙස දක්වා තිබීමෙන් වර්ෂයේ ප්‍රාග්ධන ආධාර ආදායම වැඩියෙන් දැක්විණි.

(ණ) සමාලෝචිත වර්ෂයේ මඩොල්දූව ප්‍රධාන ජැටිය ආශ්‍රිත ඉදිකිරීම් කර්මාන්තය වෙනුවෙන් ප්‍රාග්ධන ආධාර ලැබීම් රු.126,651 ක් තැන්පත් ගිණුමට බැර කිරීම නිසා එම ප්‍රමාණයෙන් ප්‍රාග්ධන ආධාර අඩුවෙන් ද, තැන්පත් වැඩියෙන් ද දැක්විණි. එම කර්මාන්තය වෙනුවෙන් කරන ලද ගෙවීම් රු.100,357 ක් අත්තිකාරම් ගිණුමට හර කිරීම නිසා ප්‍රාග්ධන වියදම් රු.100,357 කින් අඩුවෙන් ද, අත්තිකාරම් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දැක්විණි.

(ත) සමාලෝචිත වර්ෂයේ ගෙවන ලද වැටුප් අත්තිකාරම් රු.115,500 ක් පියවීම අත්තිකාරම් ගිණුමේ සටහන් නොකිරීම නිසා අත්තිකාරම් ගිණුම එම ප්‍රමාණයෙන් වැඩියෙන් දැක්විණි.

(ද) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයුර්වේද තොගය රු.120,966 ක් වුවද, මූල්‍ය ප්‍රකාශනවල රු.283,319 ක් ලෙස දක්වා තිබීමෙන් ජංගම වත්කම් රු.162,353 කින් වැඩියෙන් දැක්විණි.

(න) සමාලෝචිත වර්ෂයේ ඔක්තෝබර් 13 දින ගෙවා තිබූ රු.33,750 ක අත්තිකාරම් ලබා ගැනීම් හා පියවීම් අත්තිකාරම් ගිණුමේ සටහන් කර නොතිබුණි.

(ප) සමාලෝචිත වර්ෂයේ විවිධ අවස්ථාවල ලබා දී තිබූ රු.207,704 අත්තිකාරම්, රු.195,411 ක බිල්පත් ඉදිරිපත් කිරීමෙන් හා රු.12,293 ක් මුදලින් ගෙවීමෙන් පියවා තිබුණ ද, රු.76,750 ක වියදම් ආධාර මුදල්, දායක මුදල්, සහනාධාර වියදම් යටතේ දක්වා නොතිබීමෙන් හා රු.195,411 ක මුදල අත්තිකාරම් ගිණුමට බැර කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල වර්ෂයේ වියදම රු.76,750 කින් අඩුවෙන් ද, අත්තිකාරම් ගිණුමේ ශේෂය රු.195,411 කින් වැඩියෙන් ද දැක්විණි.

### 1.3.2 නොසැසඳූ පාලන ගිණුම්

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගිණුම් විෂයයන් 05 කට අදාළ පාලන ගිණුම් අනුව ශේෂයන් සහ උපයෝගී ලේඛන අනුව ශේෂයන් අතර රු.7,843,909 ක වෙනසක් පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම්වල වටිනාකම රු.54,448,897 ක් වුවද, ප්‍රාග්ධන යෙදවුමට ආදායමින් දායකවීමේ ගිණුමේ ශේෂය රු.52,968,897 ක් විය. මේ අනුව රු.1,480,000 ක වෙනසක් දැක්විණි.

### 1.3.3 අවිනිශ්චිත ගිණුම්

-------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.25,633 ක් වූ අවිනිශ්චිත ගිණුමේ බැර ශේෂය හඳුනාගෙන ගිණුම් ගැලපීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම

-----------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.106,586,089 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, උපලේඛන, විධිමත්ව පවත්වාගෙන යනු ලබන ණයහිමි ලේඛන හා ණයගැති ලේඛන, කාල විශ්ලේෂණ සහ ශේෂ සනාථ සහතික පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්තන වියදම රු.18,275,341 ක් වූ අතර, ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.56,181,896 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

----------------------

### 2.2.1 වරිපනම් බදු

----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවලට අදාළව අයකර ගත යුතුව තිබූ රු.6,096,521 ක් වූ වරිපනම් බදු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158(1)(අ) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 බදුකුලී

---------

(i) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.202,377 ක් වූ බදුකුලී 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 159(1) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

(ii) කතළුව උප කාර්යාලයට අයත් අංක 01 හා 02 කඩ කාමර දෙක සඳහා රු.69,945 ක බදු කුලී හිඟව තිබුණි. එමෙන්ම කඩ කාමර 06 ක් සම්බන්ධයෙන් ගිවිසුමේ 02 වන කොන්දේසිය අනුව කටයුතු කර නොතිබූ අතර හබරාදුව නව වෙළඳ සංකීර්ණයේ බිම් මහලේ පිහිටි ප්‍රදර්ශන කුටිය ගිවිසුමේ 04 වන කොන්දේසියට පටහැනිව බෙදා වෙන්කර එකතු කිරීම් කර තිබුණි.

**2.2.3 බලපත්‍ර ගාස්තු**

----------------

සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂවල ප්‍රාදේශීය සභාවට අයකර ගතයුතුව තිබූ රු.182,119 ක් වූ බලපත්‍ර ගාස්තු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 152(4) වගන්තිය ප්‍රකාරව අයකර ගැනීමට සමාලෝචිත වර්ෂය තුළදී ද කටයුතු කර නොතිබුණි.

**2.2.4 උසාවි දඩ**

-----------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට රු.198,198 ක උසාවි දඩ ලැබිය යුතුව තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

**3.1 බලය නොළත් ගනුදෙනු**

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විදේශ අධ්‍යයන චාරිකා

---------------------------

ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සලසා ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ දැක්වෙන කාර්යයන් යටතට නොගැනෙන කාර්යයක් වූ විදේශ අධ්‍යයන චාරිකා 03 ක් සඳහා සභිකයින් සහ ලේකම් ප්‍රාදේශීය සභා අරමුදලින් රු.3,661,896 ක් වැයකර තිබූ අතර විදේශගතවීම සඳහා විධිමත් අනුමැතියක් ද ලබාගෙන නොතිබුණි.

(ආ) ප්‍රාදේශීය සභා සේවක සුභසාධක සංගමය වෙත රු.200,000 ක් ගෙවීම

--------------------------------------------------------------------------

ප්‍රාදේශීය සභා අරමුදල යෙදවීම පිළිබඳ නීතිමය ප්‍රතිපාදන සලසා ඇති 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132 වගන්තියේ දැක්වෙන කාර්යයන් යටතට නොගැනෙන කාර්යයක් වූ සභිකයින් සහ කාර්යාල සේවකයින්ගේ 2014 වර්ෂයේ විනෝද චාරිකාව සඳහා ප්‍රාදේශීය සභා සේවක සුභසාධක සංගමය වෙත රු.200,000 ක් 2014 දෙසැම්බර් 31 දින වවුචර් අංක 276 මගින් ප්‍රාදේශීය සභා අරමුදලින් ගෙවා තිබුණි.

(ඇ) උත්සව වියදම්

-----------------

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය අනුව පොදු වැදගත්කමකින් යුත් කාර්යයන් පිළිබඳ උත්සව වියදම් සම්බන්ධයෙන් එක් වර්ෂයකට මුළු එකතුව රුපියල් එක් දහසක් නොඉක්මවන පරිදි වියයුතු අතර, එය ඉක්මවන විට ඒ සඳහා අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලියවිල්ලකින් ලබා ගත යුතුය. එහෙත් සභාව විසින් අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා නොගෙන සමාලෝචිත වර්ෂයේදී රු.160,227 ක් සභා අරමුදලින් වැය කර තිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) වත්කම් හා බැරකම් ප්‍රකාශ ඉදිරිපත් නොකිරීම

1988 අංක 74 දරන (සංශෝධන) පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව 2014 වර්ෂය සඳහා සභාවේ සභාපතිවරයා හැර සෙසු සභිකයින් 12 දෙනා විසින් වත්කම් හා බැරකම් ප්‍රකාශ ලබා දී නොතිබුණි.

(ආ) ප්‍රේෂණය නොකළ බදු

සභාවෙන් සපයනු ලබන විවිධ සේවාවන් වෙනුවෙන් 2012, 2013 හා 2014 වර්ෂවල අය කරගෙන තිබූ රු.2,022,594 ක එකතු කළ අගය මත බදු, රු.361,860 ක ජාතිය ගොඩනැගීමේ බදු සහ රු.194,127 ක මුද්දර බදු විගණන දිනය වූ 2015 ජූලි 17 දින තෙක් දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ප්‍රේෂණය කර නොතිබුණි.

**3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

**ඇසළ අසිරිය වැඩසටහන**

මෙම වැඩසටහන සඳහා රු.515,700 ක් වැය කිරීමට ප්‍රාදේශීය සභා පනතේ 132(ඒ) වගන්තිය යටතේ 2014 ඔක්තෝබර් 09 දින විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබා දී තිබුණි.

විගණනය සඳහා ඉදිරිපත් වූ තොරතුරු අනුව වැඩ සටහන සඳහා මුළු වියදම රු.614,407 ක් වුවද, රු.161,262 ක වියදම් සම්බන්ධයෙන් වවුචර් පත් ඉදිරිපත් නොකෙරිණි. මෙම වැඩසටහනෙන් ලද මුළු ආදායම රු.161,000 ක් වුවද, එකී ආදායම් එකතු කර ගැනීමේ දී නිකුත් කරන ලද ලදුපත් වලට අදාල උප පත්‍රිකා විගණනයට ඉදිරිපත් නොකෙරිණි.

**3.4 නිෂ්ක්‍රීය වත්කම්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

**(අ)** 2013 ඔක්තෝබර් 08 දින සිට බැකෝ යන්ත්‍රය ධාවනයෙන් ඉවත් කර විගණන දිනය වූ 2015 අප්‍රේල් 10 දින තෙක් ප්‍රධාන කාර්යාල භූමියේ දිරාපත් වෙමින් පැවතුණි. එමෙන්ම කැබ් රථයක්, ට්‍රැක්ටරයක්, අත් ට්‍රැක්ටරයක් සහ ජල බවුසරයක් ද වසර පහකට වැඩි කාලයක සිට දිරාපත් වෙමින් පැවතුණි. එසේ වුවද බැකෝ යන්ත්‍රය වෙනුවෙන් 2014 වර්ෂය තුළදී රු.381,029 ක් සභා අරමුදලින් වැයකර රිම් 02 ක් ඉදිරිපස ටයර් දෙකක් සහ ටියුබ් 02 ක් හා ආයුධ කට්ටලයක් මිලදී ගෙන තිබුණි. ඒවාද ප්‍රධාන කාර්යාලයේ ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි. එමෙන්ම බැකෝ යන්ත්‍රය සහ අනෙකුත් වාහන 04 අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 පෙබරවාරි 27 දින ප්‍රධාන කාර්යාලය සහ අහංගම උප කාර්යාලය සඳහා සභා අරමුදලින් රු.78,500 ක් වැයකර මිලදී ගෙන තිබූ වේලාව සටහන් කිරීමේ යන්ත්‍ර දෙක විගණන දිනය වූ 2015 ජූලි 17 දින වනවිට නිෂ්ක්‍රීයව පැවතුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

------------------------------

සභාව විසින් පරිහරණය කරනු ලබන වාහන 04 ක නඩත්තු හා අළුත්වැඩියා කටයුතු සභාව විසින් සිදු කරනු ලැබුව ද, විගණන දිනය වූ 2015 අප්‍රේල් 10 දින වනවිටත් එකී වාහනවල අයිතිය සභාව වෙත පවරා ගෙන නොතිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

----------------------------------------

**අයවැය පාලනය**

--------------------

අයවැය ලේඛනයෙහි ඇස්තමේන්තුගත සහ තථ්‍ය වශයෙන් ලැබූ ආදායම් අතර විචලනයන් පවතින බවත්, ඇතැම් වියදම් විෂයයන්වල ඉතිරි කිරීම් තිබූ බවත් නිරීක්ෂණය විය. ඒ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන ඇති බවක් නිරීක්ෂණය නොවුණි.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය